දැන්වීමයි
කොළඹ මහා නගර සභාව

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ රසායනාගාර සේවක III ශ්‍රේණියේ තනතුර සඳහා වන සිමීත බඳවා ගැනීම - 2026

ගරු බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා විසින් 2020.02.03 දින අනුමත කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ රසායනාගාර සේවක තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය අනුව රසායනාගාර සේවක III ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් වෙතින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව කොළඹ මහා නගර සභාවේ ඔබ දෙපාතර්මේන්තුවේ සේවයේ නියුතු III ශ්‍රේණියේ රසායනාගාර සේවක තනතුර සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලත් සේවක මහත්ම/මහත්මින් සඳහා පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ ද සහිතව 2026.07.31 දිනට පෙර නාගරික ලේකම්, නාගරික ලේකම් දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

02. රසායනාගාර සේවක III වන ශ්‍රේණිය තනතුරු සඳහා කොළඹ නගර සභාවේ සක්‍රීය සේවයේ නියුක්ත, තනතුරේ ස්ථීර කර ඇති PL-1 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන, රසායනාගාරයක වසර 05 ක් සේවය කර ඇති සේවක /සේවිකාවන් හට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

I. **තනතුරු නාමය** : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ රසායනාගාර සේවක - III ශ්‍රේණිය

II. **වැටුප් කේත අංකය** : PL 2 - 2025 (රා.ප.ව. අංක 10/2025 අනුව)

III. **මාසික වැටුප් පරිමාණය** :- 41800 – 10 X 490 – 10 X 540 – 10 X 590 – 12 X 630 – 65560/=

IV. **මෙම තනතුර ස්ථීර විශ්‍රාම වැටුප් සහිතය.**

V. **තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** : අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 2 ක් සහිතව විෂයන් හය (06) කින් සමත් වී තිබීම. ඉන් විෂයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.

VI. **පළපුරුද්ද** : කොළඹ මහා නගර සභාවේ PL-1 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරියෙකු වීම හා රසායනාගාරයක වසර 05 ක් සේවය කර තිබීම.

VII. **කායික සුදුසුකම්** : තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

VIII. **වෙනත්** :
i) තනතුරේ ස්ථීර කර තිබීම.
(ii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

IX. **වයස් සීමාව** : අදාළ නොවේ.

(41)

03. බඳවා ගැනීමේ ක්‍රමය:- අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා විභාගයකින් බඳවා ගැනීම.

04. ලිඛිත විභාගය :-

විෂය ක්ෂේත්‍රය	කාලය	මුළු ලකුණු	අවම සමත් ලකුණු
<u>විෂයානුබද්ධ දැනුම, අවබෝධය, බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම</u> I. සමාජ ක්‍රියාකාරකම් සෞඛ්‍ය හා පරිසරය පිළිබඳ සාමාන්‍ය දැනීම II. රසායනාගාර වල කාර්යයන් සම්බන්ධ අවබෝධය III. රසායනාගාර උපකරණ නඩත්තුව සම්බන්ධ සරල තාක්ෂණික දැනුම IV. සරල ගණිත ගැටළු සහිත බුද්ධි පරීක්ෂණය V. රසායනාගාර කාර්.යයන් පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.	පැය 01 විනාඩි 30	100	40%

05. තනතුර සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව 06 ක් පමණි.

06. විභාග ගාස්තු :- කොළඹ මහනගර සභාවේ 2025.01.28 දිනැති මූල්‍ය කළමනාකරණ කමිටුවේ තීරණ අංක 1137 පරිදි, කොළඹ මහනගර සභාව විසින් පවත්වනු ලබන විභාග සඳහා ගාස්තු අයකිරීම යටතේ,

(අ) කොළඹ මහනගර සභාවේ සේවයෙහි නියුතු,

- පළමුවර පෙනී සිටින අයදුම්කරුවන් හට විභාග ගාස්තු අය නොකෙරේ.
- දෙවන අවස්ථාවේ සිට
  සම්පූර්ණ විභාගය සඳහා රු. 500.00

මේ අනුව අදාළ මුදල් කොළඹ මහනගර සභාවේ නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ පරිපාලන ආදායම් ශීර්ෂ 7112015025 ගිණුමට බැරවන පරිදි කොළඹ මහනගර සභාවේ සරප් අංශය වෙත ගෙවා ලබා ගත් ලදුපත අදාළ ස්ථානයෙහි ඇලවිය යුතුය.

2026.07.31 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අත්හැරීම් හා ප්‍රමාද දෝෂ පිළිබඳ වගකීම ඒ ඒ දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරියා / විෂයභාර නිලධාරියා වෙත පැවරේ.

මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද කොළඹ මහනගර සභාවේ නාගරික කොමසාරිස්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

ඒ. ඩී. ඒස්. රෝහණ
නාගරික කොමසාරිස් (රා.ප.)
කොළඹ මහා නගර සභාව

ඒ.ඩී.ඒස්.රෝහණ
නාගරික කොමසාරිස්
කොළඹ මහා නගර සභාව

2026. ජූලි මස ..10... වන දින
කොළඹ මහා නගර සභාව
නාගරික කොමසාරිස් කාර්යාලයේදිය.